**කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව**

*දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය*

වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය

ව්‍යාපාර කළමනාකරණවේදී (සාමාන්‍යය) උපාධි පළමු පරීක්ෂණය (බාහිර) - 2022

අප්‍රේල් - 2024

**BMGT E1045 - ව්‍යාපාර නීතිය**

ප්‍රශ්න සංඛ්‍යාව : අටයි (08) කාලය : පැය 03 යි

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

ප්‍රශ්න අංක 01

අ) නීතියේ අරමුණු හතරක් නම් කර සුදුසු උදාහරණ සහිතව කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 08)

ආ) අපරාධ නීතිය සහ සිවිල් නීතිය අතර වෙනස්කම් හතරක් සඳහන් කරන්න.

(ලකුණු 04)

ඇ) පොළොන්නරුවේ පදිංචි නිමල්ට ඔහුගේ නිවස වටේට ඇති වැට අලුත්වැඩියා කිරීමට අවශ්‍යයි. මෙම අරමුණ ඉටු කර ගැනීම සඳහා ඔහුට තම අසල්වැසි සුරේන්ද්‍රගේ ඉඩමට යා යුතුය. කෙසේ වෙතත්, නිමල්ගේ වැට අලුත්වැඩියා කිරීමට තම ඉඩමට ඇතුළු වීමට සුරේන්ද්‍ර නිමල්ට ඉඩ දුන්නේ නැත. එවිට නිමල් තර්ක කළේ වැටක් හිමියෙකුට තම වැට අලුත්වැඩියා කිරීමට අසල්වැසියකුගේ ඉඩමට ඇතුළු වීමට අයිතියක් ඇති බවට පොළොන්නරුවේ ඉපැරණි චාරිත්‍රයක් පවතින බවයි. මෙම චාරිත්‍රය නීත්‍යානුකූල රීතියක් ලෙස පිළිගැනීමට අධිකරණය ඉදිරියේ ඔප්පු කළ යුතු කරුණු හතරක් කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 08)

**(මුළු ලකුණු 20)**

ප්‍රශ්න අංක 02

ආ) වලංගු අර්පනයක් සෑදීම සඳහා සපුරාලිය යුතු අත්‍යවශ්‍ය අංග හතරක් කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

ආ) සහන් සහ අරවින්ද කුඩා ගඟක විරුද්ධ ඉවුරේ සිටගෙන සිටිති. සහන් තම බයිසිකලය අරවින්දට රුපියල් 50,000 කට විකිණීම සඳහා අර්පනයක් ගොඩනගා ඉදිරිපත් කරයි. එම යෝජනාව ඇසූ අරවින්ද එය පිළිගන්නා බවට ද ශබ්ද නගා පිළිතුරු දෙයි. අවාසනාවන්ත ලෙස, එම නිශ්චිත මොහොතේ, පහතින් පියාසර කරන ගුවන් යානයක් ඒ අසලින් යන අතර, ශබ්දය නිසා අරවින්දගේ පිළිගැනීම සහන්ට ඇසෙන්නේ නැත. සහන් සහ අරවින්ද අතර ගිවිසුමක් තිබේද ? තීරණය කරන ලද නඩුවලට අවධානය යොමු කරමින් හේතු දක්වන්න.

(ලකුණු 10)

**(මුළු ලකුණු 20)**

ප්‍රශ්න අංක 03

අ) ගිවිසුම කඩකිරීමේදී ඇති විවිධ පිළියම් කෙටියෙන් සඳහන් කර පැහැදිලි කරන්න.

(ලකුණු 10)

ආ) ධනුෂ්ක ප්‍රියන්තට තම නිවස රුපියල් මිලියන 20 කට විකිණීම සඳහා අර්පනයක් ගෙන එයි. එම අර්පනය 2024 ජනවාරි 31 වන දින උදෑසන 10 දක්වා විවෘතව තැබීමට නියමිතව තිබුණි. ජනවාරි 30 වන දින ධනුෂ්ක අරුණට නිවස විකුණන ලදී. අරුණ සහ ප්‍රියන්තගේ මිතුරෙක් වන බිමල් මෙම විකිණීම පිළිබඳව ප්‍රියන්තට දැනුම් දෙයි. ප්‍රියන්ත 2024 ජනවාරි 31 උදේ 10 ට පෙර ධනුෂ්ක වෙත ප්‍රතිග්‍රහනය සහිත ලිපිය භාර දෙන ලදී. ප්‍රියන්තට අවශ්‍ය වන්නේ, ධනුෂ්කට එරෙහිව ගිවිසුම් කඩකිරීම සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමටය. ප්‍රියන්තට තීරණය කර ඇති නඩු තීන්දු කෙරෙහි අවධානය යොමු කරමින් උපදෙස් දෙන්න.

(ලකුණු 10)

**(මුළු ලකුණු 20)**

ප්‍රශ්න අංක 04

අ) අමර, බිනර සහ සුනිර කිරි මුට්ටි මිලදී ගැනීම සඳහා මාතර රුහුණු මී කිරි ආයතනය සමඟ වෙනම ගිවිසුම් ඇති කර ගත්හ. ගිවිසුම්වලට අනුව අමර, බිනර සහ සුනිර පිළිවෙලින් කිරි මුට්ටි 200, 500 සහ 800 මිලදී ගැනීමට එකඟ වූහ. රුහුණු මී කිරි ආයතනය විසින් මාතර දුම්රිය ස්ථානයේදී කිරි මුට්ටි 1500 ක් බලධාරීන් වෙත භාර දුන් අතර අදාළ තොගය පිළිවෙළින් කළුතර, මොරටුව සහ ගල්කිස්ස යන විවිධ දුම්රිය ස්ථානවල දී අදාළ පුද්ගලයාට භාර දෙන ලෙස උපදෙස් ලබා දුන්නේය. දුම්රිය ප්‍රමාද වූ අතර, කිරි මුට්ටි ගැනුම්කරුවන්ට ලබා දීමට පෙර ඒවා නරක් වී ඇත. මේ සම්බන්ධයෙන් පාඩුව දරාගත යුත්තේ කවුද? අදාළ නඩු නීතිය සමඟ ඔබේ පිළිතුර පැහැදිලි කරන්න.

(ලකුණු 10)

ආ) විකුණුම්කරුවෙකුට තමාට වඩා හොඳ අයිතියක් ගැනුම්කරුට ලබා දිය නොහැක (Nemo dat quod non habet) මෙම නීතියේ රීතිය සාකච්ඡා කර ව්‍යතිරේක පෙන්වා දෙන්න.

(ලකුණු 10)

**(මුළු ලකුණු 20)**

ප්‍රශ්න අංක 05

අ) නියෝජිතයෙකුගේ රාජකාරි පහක් අදාළ උදාහරණ සමඟ කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 10)

ආ) පළතුරු කිලෝග්‍රෑම් 10000 ක් විකිණීමට සුනිමල් තම නියෝජිතයා ලෙස නිමල් පත් කළේය. සුනිමල් පළතුරු නිමල්ට භාර දුන් අතර ඔහු ගැණුම්කරුවෙකු සොයා ගන්නා තෙක් ඒවා ඔහුගේ ගබඩාවේ ගබඩා කළේය. දින දෙකකට පසු නිමල් දුටුවේ පළතුරු නෂ්‍ය වී යාමට පටන් ගෙන ඇති බවත් ඒවායින් තම ගබඩාවේ ඇති වෙනත් භාණ්ඩ අපවිත්‍ර වීමට ඉඩ ඇති බවත්ය. එම නිසා ඔහු එම පළතුරු තොගය ප්‍රසාද්ට ඉතා අඩු මිලට අලෙවි කළේය. තීරණය කරන ලද නඩු යොදා ගනිමින් සුනිමල්ට ඔහුගේ නීතිමය අයිතිවාසිකම් පිළිබඳව උපදෙස් දෙන්න.

(ලකුණු 10)

**(මුළු ලකුණු 20)**

ප්‍රශ්න අංක 06

අ) 1890 හවුල් ව්‍යාපාර පනතට අවධානය යොමු කරමින් හවුල් ව්‍යාපාරයක ස්වභාවය, විෂය පථය සහ ලක්ෂණ විස්තර කරන්න.

(ලකුණු 10)

ආ) ශ්‍රී ලංකාවේ හවුල් ව්‍යාපාර නීතියේ මූලාශ්‍ර හතරක් නම් කරන්න.

(ලකුණු 04)

ඇ) A සහ B යනු තරඟකාරී ව්‍යාපාර කරගෙන යන වෙනම සමාගම් දෙකකි. A සමාගමේ හවුල්කරුවෙකු වන ඇන්ඩෘ, B හි ලිපිකරුවෙකු වන බර්ටි වෙත අල්ලස් ලබා දී B හි මිල සහ පාරිභෝගිකයින් පිළිබඳ රහසිගත තොරතුරු ලබා දීමට ඔහුව පොළඹවා ගත්තේය. මෙම තොරතුරු සැපයීම නිසා B ව්‍යාපාරය පාඩු ලැබීය. B සමාගම විසින් A හි අනෙක් හවුල්කරු වන පීටර්ට එරෙහිව ඔවුන්ට සිදු වූ පාඩුව අයකර ගැනීම සඳහා නීතිමය ක්‍රියාමාර්ගයක් ගනියි. ඔවුන්ට වන්දි අයකර ගත හැකිද යන්න පිළිබඳව B සමාගමට උපදෙස් දෙන්න.

(ලකුණු 06)

**(මුළු ලකුණු 20)**

ප්‍රශ්න අංක 07

අ) 2007 අංක 07 දරන සමාගම් පනතේ අඩංගු විධිවිධාන සඳහන් කරමින් පහත සඳහන් දේ පිළිබඳ කෙටි සටහනක් ලියන්න.

I. සමාගමක් සංස්ථාගත කිරීම

II. සාංගමික ව්‍යවස්ථාවලිය

(ලකුණු 10)

ආ) ජීවිත රක්ෂණය සඳහා අදාලවන සුදුසු උදාහරණ සමඟ රක්ෂණ හිමිකම් මූලධර්මය පැහැදිලි කරන්න.

(ලකුණු 10)

**(මුළු ලකුණු 20)**

ප්‍රශ්න අංක 08

අ) "වැඩ වර්ජනය කිරීම කම්කරු ප්‍රජාවේ නීත්‍යානුකූල අයිතියකි" ඔබ මෙම ප්‍රකාශය සමඟ එකඟද? හේතු දක්වන්න. වැඩ වර්ජනයක් නීති විරෝධී වෘත්තීය ක්‍රියාමාර්ගයක් බවට පත්වන්නේ කුමන තත්ත්වයන් යටතේද?

(ලකුණු 10)

ආ) පහත සඳහන් පැතිකඩවලට අදාළව සාප්පු සහ කාර්යාල සේවක පනත පිළිබඳව සටහනක් ලියන්න.

i) වැඩ කරන පැය ගණන

ii) අතිකාල ගෙවීම

iii) ව්‍යවස්ථාපිත නිවාඩු

iv) වාර්ෂික නිවාඩුව

(ලකුණු 10)

(මුළු ලකුණු 20)